සියළු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 11 | විෂයය Subject: සිංහල භාෂාව හා සාහිත්‍ය I | කාලය Time: පැය 01 |

## I කොටස

- **අංක 1 සිට 3 තෙක් ඇති එක් එක් වාක්‍යයේ තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

01. ලොකු මාමා **නා කපන වැස්සේ ම** අපේ ගෙදරට ආවේ ය.
    1. නා දලු කඩා දමන තරම් වූ වැස්ස
    2. කල්පය නහන තරම් මහ තද වැස්ස
    3. නා ගස් කපා දමන තරම් වැස්ස
    4. මෝසම් වැස්සක්

02. ඉඩම් පාඩු කීමට ගිය සේතං මුදලාලි ගේ **සේසත ම** නැති විය.
    1. සේසත් නම් වෙළඳ ව්‍යාපාරය අහිමි විය
    2. ඉඩම් සියල්ල අහිමි විය.
    3. සියලු ධන සම්පත් අහිමි විය.
    4. නඩුවෙන් පරාජය විය.

03. නිරන්තරයෙන්ම ඡන්ද දායකයෝ දේශපාලඥයන්ගේ **ඇම ගිලිති.**
    1. අල්ලස් ගනිති. 2. බිලී කොකු ලබා ගනිති.
    3. උපාය වලට අසුවෙති. 4. ආහාරපාන වලට රැවටෙති.

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. නවක විශ්ව විද්‍යාල සිසුහු තම ................ පරිදි පාඨමාලා තෝරා ගත්හ.
    1. අභියෝගය 2. අභිචාරය 3. අභිප්‍රේරණය 4. අභිමතය

05. පොදු ජනතාවගේ ................ සඳහා ඇති ස්ථාන ආරක්ෂා කිරීම අප කාගේත් වගකීමකි.
    1. පරිභෝජනය 2. සංසරණය 3. පරිහරණය 4. පරිශීලනය

06. අපේ රටට පමණක් ................ වී වර්ග වගා කර පරිභෝජනයට යොදා ගැනීම මගින් නිරෝගී දිවියකට මග සැලසේ.
    1. අන්වර්ථ 2. අනුබද්ධිත 3. ආනුෂංගික 4. ආවේණික

07. අකාරාදී පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. තෝලංගමුව, දුනුගමුව, වස්ගොමුව, විල්ගමුව
2. කෑගල්ල, අඹේපුස්ස, මාතලේ, පැල්පොල
3. තම්පලා, ගෝවා, කැකිරි, දඹල
4. අනුර, මාලන්, සරත්, විජය

08. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වාක්‍ය තෝරන්න.

1. මහළු මිනිසා අවසාන කාලය ප්‍රීතියෙන් ගත කළේය.
2. මේ පිණෙන් ඔබට සියලු සැප ලැබේවා !
3. ටිකිරි ටිකිරි වළලු හඬයි ළපටි ලියන්නේ
4. වසන්ත සුළං රැලි වලින් සැලෙන බෝතුරක ළපලු දෙස බලා මානවසිංහයෝ මහබෝ වන්නම ලියූහ.

09. අර්ථයෙන් විරුද්ධ පද දෙකක් එකතු වී සෑදෙන යුගල පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

1. සතුරු මිතුරු, එදා මෙදා, හොඳ නරක, පින් පව්
2. සැප දුක, අතන මෙතන, වස විස, අහස පොළොව
3. කෑම බීම, අග මුල, උස් මිටි, එහා මෙහා
4. හරි වැරදි, උගත් නූගත්, යාම් ඊම්, බාල මහලු

10. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් පමණක් දෙන පද පේළිය තෝරන්න.

1. අනංගයා - මදරස, මල්සර, වියොමග, පන්සිළු
2. ලිය - ස්ත්‍රිය, විලාසිනී, මාගම, මනබඳ
3. නෙළුම - අරවින්ද, සගස්පත, පංකජ, පඬෙර
4. පොළොව - වසුන්ධරා, ධරණී, සියොත්, පඨවි

- **අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

11. ඉකුත් දශක දෙක තුළ අපගේ සිංහල ගීතය භාවපූර්ණ **සුනිශිත** කලා නිර්මාණයක් බවට පත් විය.

1. යථාර්ථවත් 2. ආහ්ලාද ජනක
3. මනාසේ තියුණු වූ 4. ධ්වනි පූර්ණ

12. රජරට පැරණි වාරි කර්මාන්තයේ **ජලහරණය** සඳහා ඇළ මාර්ග ජාලයක් සකස් කර තිබූ බවට සාධක ඇත.

1. ජලය පිට කිරීම. 2. ජලය පිටාර ගැලීම.
3. ජලය ගලා යාම. 4. ජලය කාන්දු වීම.

13. ''වෙල් **දෙණිවල** ඇවිදින දෙපා රිදෙන විට විහඟ ගීත පණ පද වේවා !''

1. නියරවල් උඩ 2. වගුරු බිම්වල
3. වැලිතලා අතර 4. මිටියාවත්වල

- **අංක 14 හා 15 යන ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස් සඳහා යෙදිය හැකි තනි පදය තෝරන්න.**

14. **<u>මිනිස් වාසයක් නැති</u>** ඒ පෙදෙස ම නිසරු බිමකි.

1. ජනාකීර්ණ 2. ජන රහිත 3. ජනපදයක් වූ 4. ජනශූන්‍ය

15. ඔහු **<u>අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ</u>** සහජ හැකියාවක් ඇති සොඳුරු මිනිසෙක් විය.

1. ප්‍රති නිර්මාණාත්මක 2. ප්‍රතිභාපූර්ණ
3. නිර්මාණ ගවේෂී 4. අපූර්වතම

- **අංක 16 සිට 19 තෙක් වාක්‍ය වල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස් කවර ව්‍යාකරණ ප්‍රවර්ගයකට අයත් දැයි තෝරන්න.**

16. සැඳෑ හිරු රැසින් **ආලෝකමත් වූ** නිශ්චල වැව් දියේ සිරියෙන් හෙතෙම වශීකෘත විය.

1. නිපාත 2. තද්ධිත 3. කෘදන්ත 4. උපසර්ග

17. පොල් ගස මෙරට ජන ජීවිතය සමග **දැඩිලෙස** බැඳී පවතී.

1. නිපාත 2. තද්ධිත 3. කෘදන්ත 4. උපසර්ග

18. කහ පාට වැල් රුක් අත්තන මල් **එක යායට** පිපී තිබුණේ ය.

1. නාම විශේෂණ 2. උපසර්ග 3. කෘදන්ත 4. ක්‍රියා විශේෂණ

19. **<u>සංවර්ධනය</u>** මුවාවෙන් සිදුවන වන විනාශයට එරෙහි විය යුතුය.

1. නිපාත 2. තද්ධිත 3. කෘදන්ත 4. උපසර්ග

- **අංක 20 සිට 22 තෙක් එක් එක් ප්‍රකාශයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

20. නියම ආකාරය නොදැන වල්පල් කීම.

1. අන්ධයා ඇතාගේ හැටි කීවා වගේ. 2. කළුවා මාරපන් ගියා වගේ.
3. අබ කෑ මිනිහගෙ නහය දනවා වගේ. 4. අහසට ඉණිමං බඳින්නා වාගේ

21. නුපුරුදු දේ කිරීමට ගොස් කරදරයේ වැටීම.

1. නරියා පඟගාලේ පැටලුනා වගේ. 2. කබලෙන් ලිපට වැටුණා වගේ.
3. ආඬි හත්දෙනා කැඳ ඉව්වා වගේ. 4. අබරං සිල් ගත්තා වාගේ

22. පළපුරුදු තැනැත්තාට අත් උදව් අවශ්‍ය නැත.

1. වඳුරා හැට පිරුණත් බිමින් ගමන් නැත.
2. වැල යන අතට මැස්ස ගහන්න වගේ.
3. පනින රිළවුන්ට ඉණිමං නොතබන්න.
4. වෙහෙර ගිල්ල යකාට අග්ගලාවත් කජ්ජක්ද ?

23. ''කීවෙහු'' යන්න

1. මධ්‍යම පුරුෂ කර්තෘ කාරක අතීත කාල බහුවචන ක්‍රියාපදයකි.
2. මධ්‍යම පුරුෂ කර්තෘ කාරක අතීත කාල ඒක වචන ක්‍රියාපදයකි.
3. මධ්‍යම පුරුෂ කර්ම කාරක අතීත කාල බහුවචන ක්‍රියාපදයකි.
4. මධ්‍යම පුරුෂ කර්ම කාරක අතීත කාල ඒක වචන ක්‍රියාපදයකි.

24. ''ලිව්වෙහි'' යන ක්‍රියා පදයේ උත්තම පුරුෂ ඒක වචන වර්තමාන කර්තෘ කාරක ක්‍රියාපදය තෝරන්න.

1. ලිව්වෙමි 2. ලියමි
3. ලියනු ලබමි 4. ලියනු ලැබුවෙමු

25. උපමාවක් ඇතුළත් නොවන කවි පදය තෝරන්න.

1. නිල් කට්රොල් මලෙකැ - අවුණු වැටි කොල් මල් සෙයි
2. 'අස්වන ලියක් දැක ලිය කිඳු රඟන යුරු'
3. ළඳ ලියන්ගේ සිහින අතරේ - මැවේ ඒ රූපේ
4. පසළොස්වක සඳ පායනු වැන්නේ

26. වැරදි අදහස දෙන වරණය තෝරන්න.

1. කර්ම කාරක වාක්‍යයකදී උක්ත පදය, උක්ත කර්මය ලෙස හැඳින්වේ.
2. පූර්ව ක්‍රියාවක් සමඟ ඇත නැත යන පදවලින් වාක්‍ය අවසාන වන විට කර්තෘ පදය උක්තව තැබේ.
3. අප්‍රාණවාචී බහුවචන වලට ''ඕ, හු'' ප්‍රත්‍ය යෙදීමෙන් ප්‍රාණවාචී බවක් හැඟවේ.
4. ''යුතුය'' යන නිපාතයකින් වාක්‍ය අවසන් ඕ නම් කර්තෘ අනුක්ත රූපයෙන් තැබේ.

27. තද කළු අකුරින් මුද්‍රිත වචන අයත් ක්‍රියා පද වර්ග අනුපිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.

මම උදෑසනම **නැගිට** මුව සේදුවෙමි.
ගුරුවරයා පාඩම **උගන්වමින්** පොත් බලයි.
පදිකයා පාර **මාරුවෙද්දිම** බස් රථයක් පැමිණියේ ය.

1. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
2. පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
3. විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
4. පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා,

- **අංක 28 සිට 29 යන ප්‍රශ්න සඳහා නිවැරදි ලෙස විසන්ධි කර ඇති පිළිතුර තෝරන්න.**

28. 1. එදින් + එදා, පිළි + උතුරු, ගුරු + උතුමා, යන් + එන
2. දකුණු + අත, දිවි + ඇස, මල් + අසුන, නෙත් + අගින්
3. මුලිනු + පුටා, එකින් + එක, නීල + ඔර, ඔවුන් + ඔවුන්
4. පැහැ + ඇති, මුනි + ඉඳු, මිණි + අබරණ, සුර + ඉඳු

29. 1. පෙර + අඹර, යසි + ඉසුරු, යන + එන, භක්ත්‍ය + ආදරය
2. දෑ + අගසව්, ගමන් + ආගමන, කතා + ඊල්, පොල් + අත්ත
3. නිල් + උපුල්, රුක් + අත්තන, මුනි + උතුමා, නි + කැළැල්
4. පංච + ඒන්ද්‍රිය, ගුරු + උපදේශ, දැමි + ඉඳුරු, පර් + ඒෂණ

- **ප්‍රශ්න අංක 30 සිට 32 තෙක් ඇති ප්‍රශ්න වල ව්‍යාකරණානුකූල ව වඩාත් නිවැරදි වාක්‍ය තෝරන්න**

30. 1. නාහිමි ගිලන් වෙති.
    2. ගිජිඳුන් වනයේ සැරිසරයි.
    3. බඩුත් සමග හොරු අහුවෙයි.
    4. නිශ්ශංකමල්ල රජතුමා පිරිවර සමග රටපුරා චාරිකාවෙහි යෙදුණේය.

31. 1. විහාරමහා දේවිය වීර මාතාවකු වූවාය.
    2. මෙවර ජයග්‍රාහකයෝ පොළොන්නරුවෙනි.
    3. සබඳ අප කඳු නොවෙමු උනුන් පරයා නැගෙන
    4. විහාර ප්‍රතිසංස්කරණයෙහි යෙදුණු මහ විජය බා රජතුමා මහත් ශාසනික සේවයක් කළහ.

32. 1. අපි නීතිගරුක ශිෂ්‍යයන් වෙමු.
    2. සභාව විසිර ගියේ ය.
    3. අප රට වටා හැම පසින්ම මුහුදට ගංගා ගලා බසිති.
    4. පෙරදිග අහස අරුණාලෝකයෙන් බැබළුණහ.

33. විරාම ලකුණු වැරදි ලෙස යෙදුණු වාක්‍ය තෝරන්න.
    1. ''මහත්තයා, මෙන්න මගේ මොකුත් නොදන්නා පුත්තු දෙන්නා.''
    2. තාත්තේ, පසුගිය අවුරුදු දෙකේම මගේ හිතෙත් ඒක තිබුණා ?
    3. ''මහත්තයා ! කරුණාකරල මේක කියවන්න ! මම හරිම මෝඩයෙක් !''
    4. ''මම එන්නේ මගේ දරුවන් ඉගෙන ගන්න ඉස්කෝලෙ ඉඳල'', වාං ලුං කීවේය.

34. ඉස්පිල්ල, රකාරාංශය, පාපිල්ල, ගයනුකිත්ත යන පිල්ලම් අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
    1. සිහින, ප්‍රජාව, ඖරය, භ්‍රාන්තිය
    2. කිරණ, ප්‍රබල, රුහුණු, ගෞතම
    3. නිකිණි, ලේකම්, ග්‍රහණය, ගෞරව
    4. කියඹු, ශ්‍රමය, රුහැන, කෘමියා

- **අංක 35 හා 36 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත අර්ථයට වඩාත් සමීප අර්ථය සහිත වාක්‍ය තෝරන්න.**

35. ''දිලිසෙන විසිතුරු **<u>තුරුපෙළ</u>** සෙයින් කුසුම් පුබුදුවන්නට විය.''
    1. තුරුපෙළ යනු ගස් සමූහයයි.  2. විසිතුරු තාරකා පෙළයි.
    3. දිලිසෙන ශාක විශේෂයකි.  4. තුරුපෙළ නම් කුසුම් විශේෂයකි.

36. ''ගිම් කල නැවුලි මිලි **<u>නිල්ගල</u>** ගොසාලා'' නිල්ගල යනු,
    1. නිල්ගල වනාන්තරය යි.  2. මොනරාට පර්යාය පදයකි.
    3. නිල් පැහැති පාෂාණ වර්ගයකි.  4. නිල් අහසට තවත් නමකි.

37. හැම පදයකම සඤ්ඤක අක්ෂර යෙදී ඇති පද පේළිය දක්වන්න.

1. දඟයුග, නොඉඳුල්, වග වලස්, අනේපිඬු
2. අවසඳ, අමු ඉඟුරු, කිඳුරඟන, මධුපාන
3. මධු බිඳුව, සඳ සිසිල, කඳුළඳ, අඟ පසඟ
4. බොඳුනු දන, මිණි කඬොල්, වඩිග රජු, වෙදදුරු

- **අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

38. තලමල පිපිලා නාට්‍යයේ ඇතුළත් චරිතයක් නොවේ.

1. හේතු    2. රංබරණා    3. සිරිමාන්න    4. ගුණවංශ

39. ලීලා, ගම්පෙරළිය , යුගාන්තය යන නවකතාවල රචකයා වන්නේ,

1. ගුණදාස අමරසේකර මහතා    2. මාර්ටින් වික්‍රමසිංහ මහතා
3. පියදාස සිරිසේන මහතා    4. ඒ.වී. සුරවීර මහතා

40. ''පුද්ගල + ඉක'' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

1. පෞද්ගලික    2. පුද්ගලික
3. පෞද්ගලීක    4. පුද්ගලීක